# ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය
# "විශිෂ්ඨතම කර්මාන්තකරුවා තේරීම - 2009"
# අයදුම්පත් සඳහා උපදෙස් මාලාව

1. **සුදුසුකම්**

   2008 මාර්තු 31 සිට 2008 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය වන විට අවම වශයෙන් වසර 3ක් වත් (මහා පරිමාණ ව්‍යාපාර සඳහා වසර 4ක් වත්) ශ්‍රී ලංකාව තුළ හෝ ඕනෑම සාක් කලාපීය රටක පවත්වාගෙන යනු ලබන තනි පුද්ගල, හවුල් ව්‍යාපාර හෝ සීමාසහිත සමාගම් වලට අයත් භාණ්ඩ නිෂ්පාදන හෝ සේවා කටයුතු වල නියැලෙන ආයතනවලට මෙම තරඟය සඳහා ඉල්ලුම් කළ හැක.

   1.1 **ප්‍රාදේශීය සම්මාන**

   ප්‍රාදේශීය සම්මාන සඳහා ඉල්ලුම්කරුවන් ශ්‍රී ලංකාවේ බස්නාහිර පලාතේ නොවන වෙනත් ඕනෑම පලාතක භාණ්ඩ නිෂ්පාදන කටයුතු වල් නියැලෙන ආයතන විය යුතුයි.

   1.2 **ජාතික සම්මාන**

   ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක හෝ පලාතක භාණ්ඩ නිෂ්පාදන හෝ සේවා කටයුතු වල නියැලෙන ආයතන වලට මෙම සම්මානය සඳහා අයදුම් කළ හැක.

   1.3 **සාක් කලාපීය රටවල ව්‍යාපාරවල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන සඳහා වන සම්මානය**

   ශ්‍රී ලංකාව හැර අනෙක් ඕනෑම සාක් කලාපීය රටක භාණ්ඩ නිෂ්පාදන කටයුතුවල නියැලෙන ආයතනයක 50% කොටස් වල ශ්‍රී ලාංකීය අයිතිය හා ප්‍රධාන විධායක නිළධාරි හෝ සාමාන්‍යාධිකාරි ශ්‍රී ලාංකිකයෙකු වන (අයදුම් කරන මූල්‍ය වර්ෂය සඳහා) ඉතා විශාල, මහා හෝ මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආයතන වලට පමණක් මෙම සම්මානය සඳහා අයදුම් කළ හැක. (විශේෂ අයදුම්පතක් ඇත.)

   1.4 **සාක් කලාපීය සම්මාන**

   ඕනෑම සාක් කලාපීය රටක භාණ්ඩ නිෂ්පාදන කටයුතු වල නියැලෙන ශ්‍රී ලාංකික නොවන ඕනෑම ව්‍යාපාර ආයතනයකට මෙම සම්මානය සඳහා ඉදිරිපත් විය හැක.
   (විශේෂ අයදුම්පතක් ඇත.)

2. **ව්‍යපාර වර්ගීකරණය**

   නිෂ්පාදන අයදුම්කරුවන් සැලකිල්ලට ගෙන, සහභාගිවන ව්‍යාපාර පහත දැක්වෙන ආකාරයට වර්ගීකරණය කරනු ලබයි.

   **නිෂ්පාදන කර්මාන්ත අංශය**

   මුළු ආයෝජන වටිනාකම පදනම් කොට වර්ගීකරණය කර ඇත. එනම්,

   වසර 2008 ශේෂ පත්‍රයේ අදාල වර්ෂ අවසානයේදී දක්වා ඇති මුළු ආයෝජනය ගණනය කෙරෙන්නේ ගෙවා ඇති කොටස් වටිනාකම්, ප්‍රතිපාදන ගත කිරීම්, ශුද්ධ ලාභාංශ සහ කර්මාන්ත කටයුතු සඳහා යොදාගෙන ඇති ගොඩනැගිලි හා ඉඩම් වල වටිනාකම් සඳහා ලබාගෙන ඇති දීර්ඝකාලීන ණය එකතු කර ගත් අගයෙන් කර්මාන්ත කටයුතු වලට අදාල නොවන ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් අඩුකර ලබාගන්නා අගය මුළු ආයෝජනය ලෙස මෙහිදී සැලකේ.

   වර්ගීකරණය පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර | - රු. මිලියන 5ට අඩු හෝ සමාන (ශ්‍රී ලාංකික ව්‍යාපාර පමණි) |
| සුළු පරිමාණ ව්‍යාපාර | - රු. මිලියන 5 සිට රු. මිලියන 30 දක්වා ( -එම-) |
| මධ්‍යම පරිමාණ ව්‍යාපාර | - රු. මිලියන 30 සිට රු. මිලියන 75 දක්වා |
| මහා පරිමාණ ව්‍යාපාර | - රු. මිලියන 75 සිට රු. මිලියන 200 දක්වා |
| ඉතා විශාල ව්‍යාපාර | - රු. මිලියන 200ට වැඩි |

**සේවා අංශය**
තරඟයට සහභාගි වන සේවා කර්මාන්තයන් වර්ගීකරණය කරනු ලබන්නේ ඔවුන්ගේ මූල්‍ය වර්ෂය අවසාන දිනයේ දැක්වෙන ශුද්ධ පිරිවැටුම මතය.

වර්ගීකරණය පහත දැක්වෙන පරිදි වේ.
කුඩා සේවා කර්මාන්ත - රු. මිලියන 25 දක්වා
මධ්‍ය සේවා කර්මාන්ත - රු. මිලියන 25 සිට රු. මිලියන 100 දක්වා
මහා සේවා කර්මාන්ත - රු. මිලියන 100 සිට 500ට වැඩි
ඉතා විශාල ව්‍යාපාර - රු. මිලියන 500ට වැඩි

## 3. සම්මාන වර්ග

### 3.1 ප්‍රාදේශිය සම්මාන
බස්නාහිර පලාතේ නොවන සියළුම වර්ග වලට අයත් ව්‍යාපාර (ක්ෂුද්‍ර කුඩා, මධ්‍යම හා මහා පරිමාණ) සඳහා ස්වර්ණ, රිදී හා ලෝකඩ සම්මාන සහ කුසලතා සම්මාන දෙකක් පිරිනැමේ. ප්‍රාදේශිය සම්මාන නිෂ්පාදන කර්මාන්ත සමාගම් වලට පමණක් සීමා වේ.

### 3.2 ජාතික සම්මාන
නිෂ්පාදන අංශය - ජාතික මට්ටමින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැලී සිටින ඉතා විශාල, මහා, මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා ස්වර්ණ, රිදී හා ලෝකඩ සම්මාන සහ කුසලතා සම්මාන දෙකක් පිරිනැමේ.

සේවා අංශය - ජාතික මට්ටමේ සුළු, මධ්‍යම හා මහා පරිමාණ සේවා කර්මාන්ත අංශය සඳහා ස්වර්ණ, රිදී සම්මානය බැගින් පිරිනැමේ.

### 3.3 සාක් කලාපීය රටවල ව්‍යාපාර වල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන සඳහා වන සම්මානය
ශ්‍රී ලංකාවේ නොවන අනෙකුත් සාක් රටවල පිහිටා ඇති ශ්‍රී ලාංකික අයිතිය හා පරිපාලනය ශ්‍රී ලාංකිකයන් විසින් සිදුකරනු ලබන ඉතා විශාල මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ස්වර්ණ සම්මානය බැගින් පිරිනැමේ.

### 3.4 සාක් කලාපීය සම්මානය
සාක් කලාපයේ රටවල අදාල කර්මාන්ත හා වාණිජ මණ්ඩල මගින් නාම යෝජනා කරනු ලබන ඉතා විශාල, මධ්‍යම හෝ මහා පරිමාණ ව්‍යාපාර සඳහා ස්වර්ණ සම්මානය බැගින් පිරිනැමේ.

### 3.5 විශේෂ සම්මාන
**ත්‍රිකුණාමලය, මඩකළපුව දිස්ත්‍රික්ක සඳහා වන විශේෂ සම්මාන**

සෑම වර්ෂයකම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය මගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය විය යුතු දිස්ත්‍රික්ක 2ක් තෝරා විශේෂ සම්මානය බැගින් ප්‍රදානය කරනු ලැබේ. මෙවර මේ සඳහා ත්‍රිකුණාමලය, හා මඩකළපුව දිස්ත්‍රික්ක වල ඕනෑම ව්‍යාපාරයකට ඉදිරිපත් විය හැක.

**පළිඟු සම්මානය**
එකම අංශයක් යටතේ පිට පිට තෙවරක් ස්වර්ණ සම්මානය දිනාගන්නා නිෂ්පාදන හෝ සේවා කර්මාන්තයෙහි නියැලී සිටින ඕනෑම ව්‍යාපාර ආයතනයකට තෙවන වසරේදී පළිඟු සම්මානය හිමිවේ. එවැනි ජයග්‍රහණ ලද සමාගම්/ආයතන වසර පහක් ගතවන තුරු මෙම තරඟාවලියට සහභාගි විය නොහැක.

ගිණුම්, විගණන සහ විගණන ආකෘති සඳහා පහත සඳහන් කාල පරිච්ඡේද යොදා ගත හැක.

| ගිණුම් කාල පරිච්ඡේදය | අවශ්‍ය විගණන ගිණුම් කාල පරිච්ඡේදය | අවශ්‍ය විගණන ශේෂ පත්‍රයේ ආකෘති කාල පරිච්ඡේදය |
|---|---|---|
| ජනවාරි 1 - දෙසැ. 31 | දෙසැ. 2006/2007/2008 | - |
| අප්‍රේල් 1 - මාර්තු 31 | මාර්තු 2006/2007//2008 | දෙසැ. 2008 |
| ජුලි 1 - ජුනි 30 | ජුනි 2006/2007/2008 | දෙසැ. 2008 |
| ඔක්. 1 - සැප්. 30 | සැප්. 2006/2007/2008 | දෙසැ. 2008 |

4. අයදුම්පත පිරවීම සඳහා උපදෙස්

4.1 අයදුම්පතෙහි මූල්‍ය තොරතුරු සඳහා වන කොටස පිරවීමේදි ඇමුණුම් 1 හි සඳහන් විග්‍රහයන් යොදාගත යුතුය.

4.2 ඔබගේ අයදුම්පත් සමඟ ඔබ ආයතනය පිළිබඳ සම්පූර්ණ විස්තර අඩංගු වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතුය.

4.3 ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යාපාර වල ගිණුම් වාර්තා ලියාපදිංචි විගණකාධිකාරිවරයෙකු හෝ වරලත් ගණකාධිකාරි ආයතනයක් මගින් සහතික කල යුතුය. අනෙකුත් ව්‍යාපාර (ඉතා විශාල, මධ්‍යම හා මහා පරිමාණ සාක් කලාපීය අයදුම්පත ඇතුළුව )ඔවුන්ගේ ගිණුම් වාර්තා වරලත් ගණකාධිකාරි ආයතනයක මගින් සහතික කරවා ගත යුතුය.

4.4 කුඩා, මධ්‍යම, ඉතා විශාල හා මහා පරිමාණ ව්‍යාපාර සඳහා අයදුම්පත් කොටස් 5කින් සමන්විතයි. ඒවා "අ", "ආ" "ඇ" "ඈ" සහ "ඉ" යන කොටස් වලින් හැඳින්වේ.
"අ"කොටස - නිෂ්පාදන අංශයේ අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.
"ආ" කොටස - සේවා අංශයේ අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.
"ඇ" "ඈ" සහ "ඉ"කොටස - නිෂ්පාදන හා සේවා අංශ දෙකටම පොදුය.

4.5 කරුණාකර පහත සඳහන් ලේඛන වල ඡායා පිටපත බැගින් අයදුම්පත සමඟ අප වෙත යොමු කරන්න.
- අවසාන ගිණුම් වර්ෂ හතර සඳහා වාර්ෂික ගිණුම් වාර්තාව (වර්ෂ 2004, 2005, 2006, 2007)
- බැංකු ගිණුම් වාර්තා - ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර සඳහා පමණි. (වර්ෂ 2004, 2005, 2006, 2007)
- ණය පහසුකම් වාර්තා (අදාල කාලය සඳහා)
- සේවක අර්ථසාධක, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් වාර්තාව, බදු වාර්තා අදාල ගිණුම් වර්ෂ සඳහා
- තත්ව පාලන සහතිකය
- 2007 වර්ෂයේ අවසාන මාස හය සඳහා තත්ව පාලනය හා "මනා ගෘහ පාලනය" වාර්තා සහ "5S" සහතික
- සාමාන්‍ය රේජිස්ටරයේ සඳහන් කරුණු මත ආයතනයේ පිරිස් කළමණාකරු හෝ මානව සම්පත් කළමණාකරු වෙත සපයන ලද වාර්තාව
- 2007 කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා, අංශය මගින් ඔබගේ කර්මාන්තශාලාව වාර්ෂික සුපරීක්ෂාකිරීමේදී සපයනු ලබන වාර්තාව
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද පරිසර වාර්තාව
- මෙම සම්මාන උළෙල හා සම්මාන උළෙල වලදී ඔබ විසින් දිනන ලද සහතික පත්
- වෙනත අදාල ලේඛන
- ව්‍යවස්ථා II ප්‍රකාශන පෝරමය (අදාල ආකෘති පත්‍රය ඉල්ලුම් පත්‍රය සමඟ අමුණා ඇත.)

5. අයදුම්කිරීමේ පටිපාටිය

5.1 අයදුම්පත් ලබා ගැනීම - භාෂා තුනෙන්ම සැකසුණු අයදුම්පත් පහත සඳහන් ස්ථාන වලින් ලබාගත හැක.
අ. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය, අංක 20 පලමු මහල, ගෝල්ෆේස් කෝට් 2, කොළඹ 03
ආ. අදාල ප්‍රාදේශිය / පලාත් / දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩල
ඇ. www.cnci.biz යන වෙබ් අඩවියෙන්

5.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වර්ෂ 2008 ජූලි මස 15 වෙනිදා

5.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ඇතුලිවීමේ ගාස්තුවත් සමඟ භාරදිය යුතුය.

| | ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ සාමාජික | ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ සාමාජික නොවන |
|---|---|---|
| ක්ෂුද්‍ර පරිමාණ | රු. 1,500 | රු. 2,000 |
| කුඩා පරිමාණ | රු. 4,000 | රු. 5,500 |
| මධ්‍යම පරිමාණ | රු. 7,000 | රු. 10,000 |
| මහා පරිමාණ | රු. 12,000 | රු. 15,000 |
| ඉතා විශාල | රු. 15,000 | රු. 18,000 |

සාක් අයදුම්පත් සඳහා ඇමරිකානු ඩොලර් 300 බැගින්
මෙම ගාස්තුව වැට් එන්.බී.ටී.බදු ඇතුළුව කෙරෙන බැවින් ඒ සඳහා බදු ඉන්වොයිසියක් ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයෙන් නිකුත් කෙරේ.
සාක් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර අයදුම්පත අදාල ඇතුලිවීමේ ගාස්තුව සමඟ ඉදිරිපත් කල යුතුය.
චෙක්පත් ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය යනුවෙන් ලියා ආදායකයාගේ ගිණුමට රේඛනය කල යුතුය.

**<u>ප්‍රාදේශිය සම්මාන සඳහා අයදුම්පත්</u>**
ප්‍රාදේශිය සම්මාන සඳහා අයදුම්පත් අදාල ප්‍රාදේශිය වාණිජ හා කර්මාන්ත මණ්ඩල හරහා හෝ සෘජුවම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්න. අයදුම්පත් භාරදිය හැකි ප්‍රාදේශිය වාණිජ හා කර්මාන්ත මණ්ඩල ඇමුණුම් 2 හි දක්වා ඇත.

**<u>සාක් කලාපීය රටවල ව්‍යාපාර වල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන සඳහා වන සම්මානය</u>**
**සාක් කලාපීය රටවල ව්‍යාපාර වල නියැලෙන ශ්‍රී ලාංකික** කර්මාන්ත සඳහා වන සම්මානය වෙනුවෙන් අයදුම්පත සෘජුවම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය වෙත යොමු කරන්න.

6. ඇගයීම් හ ජයග්‍රහකයින් තේරීම

6.1 ජාතික, ප්‍රාදේශිය හා සාක් කලාපීය රටවල ව්‍යාපාර සඳහා වන සම්මාන

අ. සෘජුවම හෝ අදාල ප්‍රාදේශිය වාණිජ හා කර්මාණ්ත මණ්ඩල හරහා අප වෙත ලැබෙන සියළුම අයදුම්පත් ඇගයීමට ලක්කෙරෙන අතර විනිශ්චය මණ්ඩලය මගින් පනවා ඇති නීති රීති අනුව ජයග්‍රාහකයන් තෝරා ගනු ලැබේ.

ආ. ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ කර්මාන්තකරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.

ඇ. අවසාන වටයට තෝරා ගන්නා ව්‍යාපාර විශේෂ අධික්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යාපාර ස්ථාන වෙත පැමිණ අධික්ෂණය කිරීමට ඉඩ ඇත.

ඈ. විනිශ්චය මණ්ඩලයේ තීරණය මත සතුටුදායක මට්ටමේ අයදුම්පත් ලැබී නොමැතිනම් අදාල ව්‍යාපාර වර්ග සඳහා සම්මාන එකක් හෝ වැඩි ප්‍රමාණයක් ප්‍රදානය නොකෙරේ.

ඉ. ප්‍රාදේශිය සම්මාන සඳහා ඉල්ලුම්කර ඉතා ඉහල මට්ටමේ ප්‍රගතියක් පෙන්නුම්කරනු ලබන ව්‍යාපාර විනිශ්චය මණ්ඩලයේ තීරණය මත ජාතික සම්මාන සඳහාද සුදුසුකම් ලබයි.

ඊ. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන අතර එම තීරණය සම්බන්ධයෙන් කරනු ලබන විමසීම්, යෝජනා හෝ චෝදනා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය මගින් භාරගනු නොලැබේ.

උ. බාහිර විනිශ්චය මණ්ඩලයේ හා කර්මාන්ත මණ්ඩලයේ විනිශ්චය මණ්ඩල සාමාජිකයින් සම්බන්ධ ආයතන වලට මෙම තරඟයට ඉල්ලුම් කල නොහැක.

ඌ මෙම ක්‍රියාවලියේ සෑම අවස්ථාවකදීම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය ඉතා සාධාරණව හා වි ශ්වාසවන්තව කටයුතු කරන බවට සහතික කරන අතර, අයදුම්කරුවන් විසින් සපයනු ලබන සියලු විස්තර විනිශ්චය මණ්ඩලය පමණක් පරීක්ෂා කරන බව ද ප්‍රකාශ කරමු. තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ගේ විස්තර හා වෙනත් ලියකියවිලි සහමුලින් විනාශ කරනු ලබන්නේ බාහිර වි නිශ්චය මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ප්‍රතිපල පිළිබඳ අවසාන තීරණය ගත් පසුව නියමිත කාලයක් සුරක්ෂිතව තබා ගැනීමෙන් ද අනතුරුවයි.
ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ අභ්‍යන්තර හා බාහිර විනිශ්ච මණ්ඩල මීට ඉහත වර්ෂවලදී ද ඉතා ස්වාධිනව හා මැනවින් කටයුතු කර ඇති බව ඉතා හොඳින් දැකගැනීමටත් කාගේත් පිළිගැනීමටත් භාජනය වී ඇත.

6.2 සාක් කලාපීය සම්මාන
සාක් කලාපීය රට වල අයදුම්පත් ඇගයීම් හ ජයග්‍රාහකයන් තේරීම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් මගින් අනුමත ක්‍රමවේද හා උපදෙස් මත අදල රට වල කර්මන්ත හා වාණිජ මණ්ඩල මගින් සිදු කරනු ලැබේ.

7. ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කිරීම

වසර 2009 ජයග්‍රහකයින් පිලිබඳ දැනුම්දීමක් සැප්තැම්බර් මස 11 සිකුරාදා පවත්වනු ලබන සම්මාන ප්‍රදානෝත්සවයට අවම වශයෙන් සතියකට පෙර කෙරෙනු ඇත.

සභාපති
සංවිධායක කමිටුව

ඇමුණුම 01

මූල්‍ය තොරතුරු කොටසට පිළිතුරු සැපයීමේදී භාවිතා කළ යුතු විග්‍රහයන්

i. මුළු ආයෝජනය -
නිෂ්පාදකයන්ගේ වර්ගීකරණය සඳහා පහත සඳහන් පරිදි ගණනය කෙරේ.
- මුළු කොටස් ප්‍රාග්ධනය + සියළු ප්‍රතිපාදන සහ රඳවා ගන්නා ලද ශුද්ධ ලාභය + දීර්ඝ කාලීන ණය (කර්මාන්ත කටයුත සඳහා අදාල නොවන පොත් වල දක්වා ඇති ඉඩම් සහ ගොඩනැගිලිවල අගයන් හැර.)

ii. ශුද්ධ පිරිවැටුම - ආපසු එවුම් සහ විකුණුම් පිරිවැය් අඩුකිරීමෙන් පසු ශුද්ධ විකුණුම් පිරිවැය ගණනය කල හැක.

iii. මුළු සේවක වියදම - වැටුප් සහ වේතන, අතිකාල දීමනා, පාරිතෝෂික දීමනා, සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා අනෙකුත් සියළුම සුබසාධක දීමනා මෙයට අදාල වේ.

iv. ණය සඳහා පොළිය - දීර්ඝ කාලීන හා කෙටි කාලීන ණය සඳහා ගෙවන පොළිය.

v. රජයට ගෙවන බදු - ආදායම් බදු, වැට් බදු සහ නිෂ්පාදන කටයුතු මත එක්සයිස් බදු යනාදිය.

vi. කොටස් කරුවන්ට ලාභාංශ - ප්‍රාග්ධනයෙන් සාමාන්‍ය කොටසක් වෙනුවෙන් කොටස් කරුවන්ට ගෙවූ ලාභාංශ වටිනාකම.

vii. ව්‍යාපාරයේ රැදෙන මුදල-
   a. ක්ෂයවීමක් ලෙස - වර්ෂයේ මුළු ක්ෂයවීම
   b. සංචිතයක් ලෙස - වර්ෂය තුල ප්‍රාග්ධනයට යෙදවූ හෝ අයභාර සංචිතයට යෙදවූ මුදල
   c. ශුද්ධ ලාභය - වර්ෂයේ බදු මුදල් ගෙවූ පසු ශුද්ධ ලාභය

viii. ඉඩම් සහ ගොඩනගිලි වියදම් - ශේෂ පත්‍රයේ දක්වා ඇති ඉඩම් සහ ගොඩනැගිලි වල අගය

ඇමුණුම 02

ප්‍රාදේශීය වාණිජ හා කර්මාන්ත මණ්ඩල

1. අම්පාර දිස්ත්‍රික්ක වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
2. මඩකලපු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
3. මධ්‍ය පලාත් කාන්තා කුඩා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය
4. උතුරු මැද පලාත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
5. යාපනය වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
6. මධ්‍ය පලාත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
7. ඌව පලත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
8. ශ්‍රී ලංකා මධ්‍ය ම ආර්ථික කලාපීය වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
9. ගාලු දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
10. හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
11. කලුතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
12. කෑගල්ල දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
13. මාතලේ දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
14. මාතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
15. මොණරාගල දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
16. සබරගමුව දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
17. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
18. වව්නියා දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
19. වයඹ දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය